ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
-------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් වාර්තා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස දක්වා තිබුණු රු.273,262,450 ක් තහවුරු කිරීමට අවශ්‍ය සටහන් එම මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් සංඛ්‍යාවල විස්තරාත්මක උපලේඛන මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුමක් ලෙස ඉදිරිපත් කළ යුතු වීම. | මූල්‍ය කාර්යය සාධන වාර්තාවේ සඳහන් වූ වටිනාකම නිවැරදි කර සැසඳීම් පැහැදිලි කර ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කර ඇත. |
| (ii) | ආදායම් සංකේතාංක 02 කට අදාළව 2018 ආදායම් ඇස්තමේන්තුව අනුව ආදායම හා ආදායම් ප්‍රකාශයේ දක්වා තිබුණු ඇස්තමේන්තුගත ආදායම අතර රු.මිලියන 305 ක නොසැසඳුණු වෙනසක් විය. | ගනුදෙනු, අදාළ ලේඛන හා ප්‍රභව ලියවිලි සමග සසඳා ගිණුම්ගත කිරීම. | ගිණුම් ඉදිරිපත් කිරීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් ඇස්තමේන්තු ගත ආදායම අඩුවෙන් සටහන් වී ඇත. |
| (iii) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව, භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් ඊට අදාළ භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශන සමඟ සැසඳීමේදී රු.10,094,325,952 ක වෙනසක් පැවතුණි. මෙම වෙනස සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | ගනුදෙනු, අදාළ ලේඛන හා ප්‍රභව ලියවිලි සමග සසඳා ගිණුම්ගත කිරීම | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (iv) | මූල්‍යකාර්යසාධන ප්‍රකාශයේ වූ අග්‍රිම ශේෂය පියවීම සඳහා ඉදිරිපත් කර තිබුණු ගැලපුම් ගිණුම විධිමත් පරිදි තුලනය කර නොතිබුණු අතර එම ගිණුමේ හර සටහන්වල හා බැර සටහන්වල එකතුව අතර වෙනස හෙවත් ගැලපුම් ගිණුමේ ශේෂය රු.47,494,026 ක් විය. එහෙත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව අග්‍රිම ගිණුමේ ශේෂය රු.46,544,011 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. ඒ අනුව ඇතිව තිබූ රු.950,015 ක වෙනස සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | | |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සිගාස් පරිගණක වැඩසටහනට අනුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සතු රු.47,743,373 ක යන්ත්‍ර හා උපකරණ වටිනාකමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අනාවරණය කර නොතිබුණි. | ගනුදෙනු මග නොහැරෙන අයුරින් ගිණුම්ගත කිරීමට පියවර ගැනීම. | මෙම වටිනාකම් භාණ්ඩාගාර පොත්වල ඇතුළත් නොවීම නිසා මූල්‍ය ප්‍රකාශයේ අනාවරණය කර නැත. ඉදිරියේදී භාණ්ඩාගාරයේ සටහන් යාවත්කාලීන කර මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී අනාවරණය කිරීමට කටයුතු කරමි. |

### 1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් වූ ලැබීම් හා ගෙවීම් ඊට අදාළ භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශන සමඟ සැසඳීමේදී රු.2,481,058 ක වෙනසක් පැවතුණි. | ගනුදෙනු, අදාළ ලේඛන හා ප්‍රභව ලියවිලි සමග සසඳා ගිණුම්ගත කිරීම. | වෙනස්කම් හඳුනාගෙන සැසැඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. |

### 1.6.4 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනුව සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 10 කට පිළිතුරු 2019 මැයි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා/ ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට වහාම පිළිතුරු ලබා දිය යුතුය. එසේ පිළිතුරු ලබාදී ම ප්‍රමාද විය හැකි විමසුම් වේනම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය හා එකගවෙමි. විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. |

### 1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 1.6.1 (ඇ) ඡේදය ප්‍රකාරව විගණන විමසුම් 10 කට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර විගණන විමසුම්වලට කඩිනමින් පිළිතුරු ලබාදිය යුතුවීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය --------------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 118 | විවිධ ආදායම් ප්‍රභවයන් යටතේ මුදල් එකතු කර ගැනීමේ දී වැරදීම් නිසා අයකරගෙන තිබුණු රු.245,800 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ආපසු ගෙවා තිබුණද, ඒ සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර ආදායමින් ආපසු ගෙවීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම. | මෙම ආපසු ගෙවීම් භාණ්ඩාගාර පොත්වල ආදායම ගිණුම්ගත කිරීමට ප්‍රථම අදාල මාසය තුළදී සිදු කර ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 165(4) | වෙරහැර කාර්යාලයේ දෛනිකව එකතුවන මුදල් මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සේප්පුගත කර නොතිබුණි. එමෙන්ම, යහපත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ලෙස, සරප් අංශය භාර සහකාර කොමසාරිස්වරයා භාරයේ සේප්පුවේ එක් යතුරක් පැවැතිය යුතු වුව ද, යතුරු සියල්ල සුළු මුදල් භාරකරු භාරයේ පැවැතිණි. | යතුරු සහ මුදල් භාරව සිටින නිලධාරීන් සම්බන්ධව විධිමත් අධීක්ෂණයක් පවත්වා ගත යුතුවීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 175(1) හා (2) | විවිධ කරුණු 08 ක් යටතේ ආදායම් එක් රැස් කළ ද, ඒවා එකම ලේඛනයක සටහන් කිරීම නිසා එක් එක් කාරණාව යටතේ ලද මුදල් වෙන වෙනම හඳුනාගත නොහැකිව තිබුණි. මේ නිසා හිඟ ආදායම් පිළිබඳ නිවැරදි වාර්තා ලබා ගැනීම, ඒවා අයකර ගැනීමට විධිවිධාන යෙදීම හා හිඟ ආදායම නිවැරදිව අයකර ගැනීම අවිනිශ්චිත විය. | එකතු කරන ලද ආදායම් ප්‍රභව හඳුනාගතහැකි අයුරින් ලේඛන පවත්වා ගත යුතු වීම. | ආදායම් රැස්කිරීම් පිළිබඳ වාර්තා වර්ගීකරණය කර නිවැරදිව පවත්වාගෙන යාමට දැනට කටයුතු කර ඇත. |
| (ආ) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ ------------------------ | | | |

| | | | |
|---|---|---|---|
| 2015 ජුලි 20 දිනැති අංක 01/2015 චක්‍රලේඛයේ 04 (අ) හා (ආ) ඡේද | 1995 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා හිඟ ආදායම් පැහැදිලිව දැක්වෙන අයුරින් ක්‍රමවත්ව වාර්තා පවත්වා නොතිබුණු අතර අයවීමට ඇති හිඟ ආදායම් තවදුරටත් එකතුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. එනම්, මූල්‍ය ප්‍රකාශන අනුව, සමස්ත හිඟ ආදායම වාර්ෂිකව වැඩිවීමේ ප්‍රවනතාවක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කිරීම. | හිඟ ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට දුෂ්කරතා පැවැති බැවින්, වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී හිඟ ආදායම් අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වාර්ෂික ඇස්තමේන්තු අනුව, ආදායම් සංකේත අංක 1003 – 07 – 09 යටතේ කාබන් බද්ද අය කිරීමෙන් අපේක්ෂා කළ ආදායම රු.මිලියන 2,500 ක් වුවද, එම අපේක්ෂිත ආදායම් ඉපයීම ශූන්‍ය ලෙස සලකා ඇස්තමේන්තුව සංශෝධනය කරන ලෙස දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත දන්වා තිබුණි. කාබන් බදු අය කිරීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොතිබීම මෙයට හේතුව වී තිබුණි. මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ වාර්ෂික ආදායම් ප්‍රකාශනයේ මෙම අපේක්ෂිත ආදායම දක්වා නොතිබුණි. | වර්ෂය තුළ ඉටුකළ හැකි කාර්යයන් පමණක් ඇස්තමේන්තුගත කිරීම. | |
| (ආ) | ආදායම් සංකේතාංක 1003-01-00 යටතේ වූ සුඛෝපභෝගී මෝටර් වාහන බදු සම්බන්ධයෙන් 1995 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා හිඟ ආදායම් ගණනය කිරීමේ කටයුතු 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණ ද, එම හිඟ ආදායම් පිළිබඳ වාර්තා කිසිවක් විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි. මේ නිසා එම කාල පරිච්ඡේදයට අදාළ හිඟ ආදායම කොපමණ ද යන්න විගණනයේදී | සියලු වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

තහවුරු කරගත නොහැකි විය. කෙසේ නමුත්, 2009 වර්ෂයට පෙර වර්ෂ 13 ක් වෙනුවෙන් එවකට අයකර තිබුණු හිඟ බදු ආදායම රු. මිලියන 34.9 ක් විය.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා වැය විෂයයන් 08 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක් ඉතිරි වී තිබුණි.<br>(ආ) මු.රෙ.66 මගින් වැය විෂයයන් 06 ක ඇස්තමේන්තු වටිනාකමින් සියයට 17 සිට 94 දක්වා ප්‍රතිශතයක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණු අතර තවත් වැය විෂයයන් 08 ක ඇස්තමේන්තු වටිනාකමින් සියයට 12 සිට 560 දක්වා ප්‍රතිශතයක් වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කරගෙන තිබුණි. | තාත්වික ලෙස ඇස්තමේන්තු සකස් කිරීම | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළැඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක 267/2018 හා 2018 නොවැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදයේ විධිවිධාන නොසලකා, 2018 වර්ෂය තුළ අවස්ථා 05 ක දී ඇති කරගත් රු.274,501 ක බැදීම් මූල්‍ය ප්‍රකාශ සමඟ වාර්තා කර නොතිබුණු අතර ඒවා 2019 වර්ෂය තුළ දී පියවා තිබුණි. | නීති,රීති හා රෙගුලාසි අනුව කටයුතු කර බැරකම් හා බැදීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සමඟ අනාවරණය කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) මියගිය අයගේ වර්ෂ 05කට වඩා කල්ගත වී තිබුණු එකතුව රු.755,811ක ණය ශේෂ 16 ක් නිරවුල් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වැනි වගන්තිය වෙත අවධානය යොමු කෙරේ.<br><br>(ආ) මු.රෙ.485 (4) සහ අංක 89 හා 1993 ඔක්තෝබර් 22 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තුන් මසක් ඇතුළත නිරවුල් කළ යුතු විය. එහෙත්, ස්ථාන මාරු වී ගිය නමුත් 2018 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් නොකළ එකතුව රු.226,230 ක ණය ශේෂ 04 ක් පැවැති අතර ඒවා නිරවුල් කිරීමට ප්‍රමාද වූ කාලය වර්ෂ 05 ක්ද ඉක්මවා ගොස් තිබුණි.<br><br>(ඇ) විශ්‍රාම වැටුප් අත්හිටවූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු.302,722 ක ශේෂය වර්ෂ 05කට වඩා පැරණි විය.<br><br>(ඈ) අවසාන වාරිකය අයකර වර්ෂ 02කට වඩා කල්ගත වී තිබුණු වැඩ තහනම් කළ නිලධාරීන් 19 දෙනෙකුගෙන් අය විය යුතු රු.මිලියන 1.3 ක ණය ශේෂ එම ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. ඒ තුළ වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු.මිලියන 1.1 ක ශේෂ 17 ක් ඒ අතර විය.<br><br>(ඉ) අවසාන වාරිකය අයකර වර්ෂ 05 කට වඩා කල්ගත වී තිබුණු සේවය අත්හැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය විය යුතු රු.185,388 ක ණය ශේෂ එම ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. | සියලු ණය ශේෂ ප්‍රමාදයකින් තොරව විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට පියවර ගැනීම. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සම්බන්ධයෙන් සඳහන් කර ඇති, (අ) – (උ) දක්වා නිරීක්ෂණ හා එකඟ වෙමි. පැරණි හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා මෙතෙක් දැරූ සෑම උත්සාහයක්ම අසාර්ථක වී ඇති අතර, තවදුරටත් ඒ පිළිබඳව කටයුතු කරගෙන යනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| **(ඊ)** | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට එකතුව හා එදිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර රු.මිලියන 2.2 ක වෙනසක් පැවැතිණි. | ගනුදෙනු, අදාළ ලේඛන හා ප්‍රභව ලියවිලි සමග සසඳා ගිණුම්ගත කිරීම | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සම්බන්ධයෙන් සඳහන් කර ඇති, **(අ) – (උ)** දක්වා නිරීක්ෂණ හා එකඟ වෙමි. පැරණි හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා මෙතෙක් දැරූ සෑම උත්සාහයක්ම අසාර්ථක වී ඇති අතර**,** තවදුරටත් ඒ පිළිබඳව කටයුතු කරගෙන යනු ලැබේ. |
| **(උ)** | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව අත්තිකාරම් ගිණුමේ 2018 වර්ෂයේ ආරම්භක ශේෂය සහ එම වර්ෂය තුළ සිදු කළ හර හා බැර කිරීම් වටිනාකම්, එම වර්ෂයේ අත්තිකාරම් බී ගිණුමේ එම ශේෂ හා සැසඳීමේ දී එකතුව රු.මිලියන 2.48 ක වෙනසක් පැවැතිණි. එහෙත්, දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අතර වෙනස නිවැරදි නොවීමට අදාළ වූ හේතු දැක්වෙන ප්‍රකාශනයේ එම වෙනස්කම් සටහන් කර නොතිබුණි. | | |
| **(ඌ)** | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව උපරිම වියදම් සීමාව හා අත්තිකාරම් බී ගිණුමේ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුව එම ශේෂය අතර රු.මිලියන 10 ක නොසැසඳුනු වෙනසක් පැවැතුණි. එය යතුරු ලියන දෝෂයක් ලෙස විගණනය වෙත දන්වා තිබුණි. | -ඒම- | උපරිම වියදම් සීමාව රු.මිලියන 35 ක් වෙනුවට ප්‍රමාද දෝෂයකින් රු.මිලියන 25 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන්වී ඇත. |
| **(එ)** | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2018 දෙසැම්බර් 01 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා එදිනට එම අත්තිකාරම් ගිණුමේ පාලන ගිණුම අනුව ශේෂය අතර රු.5,000 ක නොසැසැඳීමක් පැවතිණි. එමෙන්ම, වර්ෂය තුළ සිදුකළ ගෙවීම් අතර රු.මිලියන 1.5 ක් හා ලැබීම් අතර රුම.මිලියන 1.5 ක වෙනසක් ද පැවතිණි | -ඒම- | මෙම වෙනස වර්ෂාරම්භයේ සිට පැවත එන්නක් වන අතර පසුව නිවැරදි කර ඇත. |

## 2.5 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තැන්පත් ගිණුම් 03කට අදාළව 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්මවූ රු.මිලියන 24.68 ක තැන්පතු ශේෂ 31 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි. එම වටිනාකම තුළ රු.මිලියන 24.4 ක කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් ද විය. | නීති,රීති හා රෙගුලාසි අනුව කටයුතු කිරීමට පියවර ගැනීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | මු.රෙ.571 (1) පරිදි, සෑම අර්ධ වර්ෂයක් අවසානයේ දී ම කල් ඉකුත් වූ සියලුම තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | | |
| (ඇ) | තැන්පතු ගිණුම් 03 ක කේවල ශේෂ ලැයිස්තු අනුව | සියලු ගනුදෙනු | පිළිතුරු ලබා දී |

| | | | |
|---|---|---|---|
| | 2018 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාලවල රු.මිලියන 7.6 ක තැන්පතු ශේෂ පැවැතියද, එදිනට පිළියෙල කර තිබුණු තැන්පතු වර්ග අනුව තැන්පතු ශේෂ සාරාංශයේ එම ශේෂ සටහන් කර නොතිබුණි. | ඇතුළත් වන පරිදි වාර්තා පිළියෙල කිරීම. | නොතිබුණි. |
| (ඇ) | තැන්පත් කළ මුදල, නැවත ගෙවිය යුතු අය වෙතොත් ඒ අයගේ නම සඳහන් කළයුතු වුවද, එසේ නොකර රු.285,284 ක තැන්පතු 26 ක් නිරවුල් නොවූ චෙක්පත් ලෙස තැන්පතු ගිණුමේ දක්වා තිබුණි. | නිවැරදි ලෙස වාර්තා පිළියෙල කිරීමට පියවර ගැනීම. | බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් ආදායමට බැර කිරීමට පෙර තාවකාලිකව පොදු තැන්පත් ගිණුමට මාරු කිරීමේදී මෙම වරද සිදුවී ඇත. ඉදිරියේදී පොදු තැන්පත් ගිණුමට කරනු ලබන මාරු කිරීම් වෙන් වෙන්ව දැක්වීමට පියවර ගනු ලැබේ. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශනවල රු.107,498 ක හඳුනා නොගත් ගෙවීම් හා රු.118,490 ක හඳුනා නොගත් ලැබීම් පැවැති අතර, ඒවා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. . | ගනුදෙනු නිසි පරිදි හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කිරීම. | මෙම හඳුනානොගත් ලැබීම් හා ගෙවීම් වැරදි නිවැරදි කිරීමේ සටහන් ලෙස යොදන ලද ඒවා වන අතර සත්‍ය ලැබීම් / ගෙවීම් නොවන බව දන්වමි. මේවා බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව, නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ එකතුව රු.507,148 ක චෙක්පත් පැවැතිය ද, ඒවා මු.රෙ.396 (ඇ) අනුව ආදායමට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි. එම වටිනාකම තුළ වර්ෂය ඉක්මවූ රු.107,543 ක චෙක්පත් ද විය. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම. | මාස 06 ඉක්මවූ බැංකුවට ඉදිරිපත් නොවූ ගෙවීම් බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී හඳුනාගෙන ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවාලාභීන් වෙත වාහන පරීක්ෂණ වාර්තා කාර්යක්ෂමව ලබාදීම සඳහා ජර්මන් රජයේ පරිත්‍යාගයක් ලෙස වේරහැර වාහන පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයට 2004 වර්ෂයේදී ලද පරීක්ෂණ උපකරණ 08 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. එම උපකරණ ජර්මනියේ නිෂ්පාදිත වුවත්, ලද තොරතුරුවලට අනුව, වර්තමානයේ ඊට වඩා නවීන තාක්ෂණයෙන් යුතු උපකරණ වෙළඳපොළ භාවිතයට හඳුන්වා දී ඇති බැවින් සාපේක්ෂ ලෙස ඒවායේ තාක්ෂණික ගුණාත්මකභාවය ද පිරිහී තිබිණි. | අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කිරීම හා වඩා වාසිදායක වන පරිදි කාලීනව තීරණ ගැනීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

### 3.2 පාඩු හා හානි

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වේරහැර කාර්යාලයට කිලෝ වොට් 500 ක ධාරිතාවයකින් යුතු විදුලිජනක යන්ත්‍රයක් භාවිතයට ගැනීමෙන් පසු වොට් 200 ක් වූ පෙර පැවැති යන්ත්‍රය අවශ්‍යතාව තීරණය කර වෙනත් අංශයක ස්ථාපිත කිරීමට හෝ එසේ නොමැති නම් අපහරණය කිරීමට හෝ පියවර ගැනීම වෙනුවට එය තවදුරටත් එම අංශයේම අභාවිතව පවතින හෙයින්, එහි සේවා ගිවිසුම හා අළුත්වැඩියා වෙනුවෙන් ගෙවූ රු. 451,720 ක් ද නිෂ්ඵල වී තිබුණි.<br><br>(ආ) ජාත්‍යන්තර රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව මගින් ලංකා ඔටෝමොබයිල් සංගමය වෙත පැවරීම නිසා අංක 1594/27 හා 2009 මාර්තු 26 ගැසට් නිවේදනයේ සඳහන් 2009 අංක 01 දරන රියදුරු බලපත්‍ර (අයභාර) නියෝගවල පරිදි දෙපාර්තමේන්තුව මගින් ආදායම් ඉපයීමක් සිදුකර නොතිබුණු අතර යම් කාල සීමාවක් තුළ නිකුත් කළ | (i) රජයට වාසිදායක වන පරිදි තීරණ ගැනීමට කටයුතු කිරීම.<br>(ii) විදුලි ජනක යන්ත්‍රය සුදුසු පරිදි භාවිතයට ගැනීම.<br>(iii) රජයට ආදායමක් ලබාගත හැකි පරිදි රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යයක් සැලසුම් කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | රියදුරු බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ විස්තර කිසිවක් දෙපාර්තමේන්තුව සතු ව නොතිබුණි. එමෙන්ම, මෙම කාර්ය වෙනුවෙන් ලංකා ඔටෝමොබයිල් සංගමය හා දෙපාර්තමේන්තුව අතර කිසිදු ලිඛිත එකඟතාවයකට එළැඹ තිබුණු බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. | | |
| (ඇ) | වේරහැර කාර්යාල පරිශ්‍රයේ පවත්වාගෙන යන මෙට්‍රොපොලිටන් ආයතනය, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, කිරිහල ආදී ආයතන විසින් පරිභෝජනයට ගන්නා ජලය හා විදුලිය වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අයකර නොතිබුණි. එමෙන්ම, ආයතන පරිශ්‍රය භාවිතා කිරීම සඳහා ඒම ආයතන දෙපාර්තමේන්තුව සමඟ එළැඹුණු ගිවිසුම් කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොවීය. | රජයට වාසිදායක වන පරිදි තීරණ ගැනීමට කටයුතු කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 3.3 මෙහෙයුම් දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (අ) | සේවාලාභීන් විසින් දෙපාර්තමේන්තුවේ ගිණුමට කරන එක් එක් ගෙවීම් වෙනුවෙන් රු.30 ක මුදලක් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ වූ මහජන බැංකු ශාඛාව මගින් අය කළද, දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිල්ල භාවිතා කිරීම වෙනුවෙන් එම බැංකුවෙන් කුලී අය කිරීමට පියවර ගෙන නොතිබුණි. එමෙන්ම, දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ පවතින කිරිහල, රක්ෂණ ආයතනය, ඡායා පිටපත් අලෙවිසැල වැනි අනෙකුත් ආයතනවලින් ද කුලී ආදායම් අයකර නොතිබුණි. | රජයට වාසිදායක වන පරිදි තීරණ ගැනීමට කටයුතු කළ යුතුවීම සහ කුලී අයකළ හැකි ආයතනවලින් කුලී අයකර ගැනීම සොයා බැලීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | වේරහැර පරිශ්‍රයේ ලිපිගොනු ගබඩාකරණය සිදු කිරීමට පෙර තාවකාලිකව ලිපිගොනු තැන්පත් කිරීම සඳහා බහාලුම් 18 ක් භාවිතයට ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.<br>(i) බහාලුම් 06 ක ලිපිගොනු පොහොර කවරවල බහා අවිධිමත් ලෙස ගොඩගසා තිබුණි. එමෙන්ම, නිසි නඩත්තුවක් නොමැතිවීම නිසා බහාලුම් 02 ක පැවැති වාහන ලිපිගොනු දිරාපත් වෙමින් පැවැතුණි. | වාහන ලිපිගොනු සුරක්ෂිත කිරීම සඳහා ප්‍රමාදයකින් තොරව විධිමත් ක්‍රියාමාර්ග ගැනීම. | |
| | (ii) යතුරුපැදි නව ලියාපදිංචි හා පැවරුම් මෙන්ම "වයි" කාණ්ඩයේ ත්‍රීරෝද රථ ලිපිගොනු නව ලේඛනාගාරයේ ඇසිරීමට මේ දක්වාම පියවර නොගැනීම නිසා ඒවා තවදුරටත් බහාලුම් තුළ | සියලුම ලිපිගොනු ඇසිරීම සඳහා ලිඛිත උපදෙස් ලබා දීම හා එම කටයුතු නිරන්තර | |

| | | |
|---|---|---|
| අනාරක්ෂිතව පැවැතුණි. | අධීක්ෂණයට ලක් කිරීම. | |
| (iii) ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ ප්‍රමිතීන්ට පටහැනිව ආරක්ෂිත ගොනු (Back Up) සියල්ල ලේඛනාගාරයේ ලිපිගොනු විස්තර ඇතුළත් තොරතුරු පද්ධතියට අදාළ සර්වර් යන්ත්‍රය තුළම පවත්වාගෙන ගොස් තිබුණි. | ආරක්ෂිත ගොනු වෙනම ස්ථානයක ස්වාධීනව පවත්වා ගැනීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**3.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මු.රෙ. 177(1) පරිදි, එකතු කරගන්නා මුදල් හැකිතාක් ඉක්මනින් බැංකුගත කළ යුතු වුව ද, වේරහැර කාර්යාලයේ දෛනිකව එකතුවන මුදල් ඊට පසු දින බැංකුගත කිරීමේ පිළිවෙතක් අනුගමනය කර තිබුණි. ඒ අනුව, සිකුරාදා දින එකතුවන මුදල් එළැඹෙන සඳුදා දින දක්වා ප්‍රධාන සරප්ගේ සේප්පුවේ රඳවා ගැනේ. මේ නිසා මුදල් අවභාවිතා වීමේ අවදානමක් පැවතිය හැකි අතර අවස්ථා 15ක දී එකතුව රු.මිලියන 39.6 ක් වූ මුදල් ප්‍රමාණයක් දින 04 ත් 05 ත් අතර කාල පරාසයක් තුළ එලෙස රඳවා තිබුණු බව මාස 03ක නියැදි පරීක්ෂාවක දී නිරීක්ෂණය විය. ඒ අනුව එක් දිනයක රඳවා තබා ගන්නා සාමාන්‍ය මුදල රු.මිලියන 03ක් පමණ විය. | **(i)** මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම.<br>**(ii)** මෙම තත්ත්වය මඟහරවා ගැනීමට සේවාලාභීන්ට සිය සේවා ගාස්තු සෘජුව බැංකුගත කළ හැකි වන පරිදි වේරහැර කාර්යාල පරිශ්‍රය තුළ රජයේ බැංකු ශාඛාවක් ස්ථාපනය කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම. | වේරහැර කාර්යාලයේ රැස්කරනු ලබන මුදල් දිනපතා බැංකු ගත කිරීම සඳහා මහජන බැංකුව සමඟ දැනට කටයුතු කරමින් පවතී. |
| (ආ) වේරහැර කාර්යාලයේ නව රියදුරු බලපත්‍ර සඳහා මාර්ගගත ක්‍රමයට (Online) විභාග පැවැත්වීම වෙනුවෙන් වූ විභාග ශාලාව ඉදිකිරීමටරු. මිලියන 41.2ක් වැයකර තිබුණු අතර 08 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් දෛනිකව මෙහි රාජකාරියේ නිරත වේ. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි ය. | විනිවිදභාවයකින් විභාග පැවැත්වීම සඳහා අවශ්‍ය වන රෙගුලාසි ස්ථාපිත කර ඒවා යාවත්කාලීනව පවත්වා ගැනීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

| | | |
|---|---|---|
| (i) විභාග මුර 03 ක් දෛනිකව පවත්වන අතර ඒ සඳහා වාරයකට අපේක්ෂකයන් 143 දෙනෙකුට පහසුකම් සලසා තිබුණි. එහෙත් වරකට අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම 120 දෙනෙකුට සීමා කිරීම නිසා සෑම දිනකම පරිගණක 69 ක අතිරික්තයක් පැවැතුණි. කෙසේනමුත් එම අතිරික්ත භාවිතා කර සුවිශේෂී මුරපද පහසුකම මඟින් අතිරේක අයදුම්කරුවන් ලියාපදිංචි කර තිබුණි. එම අයදුම්කරුවන්ගෙන් මුදල් අය කිරීම පිළිබඳ කිසිදු තහවුරුවක් විගණනය වෙත ඉදිරිපත් නොවීය.<br><br>(ii) මෙම සුවිශේෂී මුරපද භාවිතා කිරීමේ පහසුකම නිලධාරීන් 51 දෙනෙකුට ලබාදී තිබුණි. ඒ තුළ වේරහැර කාර්යාලයේ නිලධාරීන් 16 දෙනෙකුට මෙම පහසුකම් ලබා දී තිබුණු අතර ඉන් 14 දෙනෙකුම මාණ්ඩලික නොවන නිලධාරීන් විය.<br><br>(iii) විභාග අංශයට අනුයුක්ත සහායක කාර්ය මණ්ඩලය සඳහා ස්ථාන මාරුවීම් ලබා දී නොතිබුණු අතර ඔවුන් වසර 06 ත් 13 ත් අතර කාලයක සිට දෛනිකව මෙම රාජකාරීවල නිරතව සිටින බව නිරීක්ෂණය විය. | විනිවිදභාවයකින් විභාග පැවැත්වීම සඳහා අවශ්‍ය වන රෙගුලාසි ස්ථාපිත කර ඒවා යාවත්කාලීනව පවත්වා ගැනීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ඇ) විදුලිජනක යන්ත්‍රය සඳහා 2016 වර්ෂය තුළ අවස්ථා දෙකක දී මිල දී ගත් ඉන්ධන ලීටර් 8400ක් සඳහා රු. 798,000ක් ගෙවා තිබුණ ද, ඒවා විදුලිජනක යන්ත්‍රය සඳහා උපයෝජනය කළ ආකාරය පිළිබඳ දත්ත කිසිවක් නොතිබුණි. | වියදම් වෙනුවෙන් විධිමත් සාක්ෂි ගොනුකර තබා ගැනීම. | |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11.2 සහ 11.6 යන අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු නමුත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා එකී අරමුණු හඳුනාගෙන ඒවා ඉටුකර ගැනීමට අදාළ වැඩසටහන් සකස් කර නොතිබුණි. | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග | පිළිතුරු ලබා දී නොතිබුණි. |

ගැනීම.

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අංක 05/2012 හා 2012 දෙසැම්බර් 30 දිනැති දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 06 ඡේදය අනුව, එක් ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වෙනත් සේවා ස්ථානයකට මාරු කළ යුතුය. එහෙත් ඊට පටහැනිව 2018 දෙසැම්බර් 31 දින වන විට චේරහැර කාර්යාලයේ නිලධාරීන් 07 දෙනෙකු හා 05 දෙනෙකු පිළිවෙලින් වසර 11 කට හා වසර 05 කට අධික කාලයක සිට මෙම සේවා ස්ථානයේ සේවයේ නියුක්ත කර තිබුණි. මෙම තත්ත්වය පිළිබඳ මීට පෙර අවස්ථා කිහිපයකදී විගණනය මගින් පෙන්නුම් කර දී තිබුණද, එය නිවැරදි කර නොතිබුණි. | නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර නියමිත සේවා කාළය අවසන් කර ඇති නිලධාරීන් ස්ථාන මාරු කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 92 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍යතාවය පිළිබඳ සැලැකිලිමත් වී පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |